**ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලය සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල අතර 2016 මාර්තු 24 දින අංක 940 දරන ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.1 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. මඩකලපුවේ නව සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයක් ඉදිකිරීම හා ප්‍රජාවට ගුණාත්මක සෞඛ්‍ය ආරක්ෂණ සේවාවක් සැපයීම තුලින් ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 6,473.28 ක් වන අතර ඉන් රු.මිලියන 5,073.10 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 10 ක් අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන කුවේට් අරමුදල මගින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. එහි කටයුතු 2016 අගෝස්තු 01 දින ආරම්භ කර තිබුණු අතර, 2021 මැයි 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.2 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය වාර්තාව විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය වාර්තාව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.5 මූල්‍ය වාර්තාව විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

**-------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය වාර්තාව, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය වාර්තාව පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය වාර්තාවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය වාර්තාවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. භෞතික කාර්යසාධනය**

**--------------------------**

**2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

**---------------------------------------------**

සපයා තිබූ තොරතුරු ප්‍රකාරව, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නියමිත දිනය වූ 2018 ජනවාරි 28 දිනය ඉක්මවා මාස 17 ක ප්‍රමාදයකින් පසු 2019 මැයි මස 09 වන දින පිරිනමා තිබුණි. කෙසේවුවත්, ඉදිකිරීම් කටයුතු 2019 මැයි 27 දින දී ආරම්භ කර තිබුණි.

### 2.2 ඌණ උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කරන භෞතික කටයුතු වල මන්දගාමී ප්‍රගතියේ ප්‍රතිඵලයක් ලෙස ණය දෙන නියෝජිතායතන මගින් ව්‍යාපෘතියේ සංරචක 04 ක් යටතේ ලබා දී තිබූ රු. මිලියන 288.70 ක ප්‍රතිපාදන වලින් රු. මිලියන 31.30 ක් පමණක් භාවිතා කර තිබුණි. | ව්‍යාපෘති කාලය අවසාන වන විට වෙන්කරන ලද අරමුදල් සම්පූර්ණයෙන් භාවිතා නොකර තිබීමට හැකි වීම. | අදහස් දක්වා නොතිබුණි. | විධිමත් මූල්‍ය සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 2.3 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 2016/01 හා 2016 මාර්තු 24 දිනැති චක්‍රලේඛයෙන් නියම කර ඇති පරිදි රේඛීය අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයෙන් සාමාජිකයින් 04 දෙනෙකු පත් කිරීම වෙනුවට රේඛීය අමාත්‍යාංශය, ක්‍රියාත්මක කිරීමේ ආයතනය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය සහ උපදේශක කාර්ය මණ්ඩලය මගින් සමන්විත සාමාජිකයින් 13 දෙනෙකු පත් කර තිබුණි. | රෙගුලාසි වලට අනුකූල නොවීම. | අදහස් දක්වා නොතිබුණි. | කාර්යක්ෂමව තීරණ ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම් කමිටුවේ සාමාජිකයින්ගේ සංඛ්‍යාව අඩු කළ යුතුය. |